දෙවසරකට පෙර රත්නපුරයේ දැරියක් ඝාතනය කළ බවට පැවසෙන සිදුවීමේ සැකකරු අත්අඩංගුවට ගත් පුවත දිනමිණ පුවත්පත තුළ ජූලි 27 හා 28 දෙදින තුළ පළවී තිබිණි. මෙම පුවත් වාර්තාවන් දෙක පිළිබඳව අපගේ නිරීක්ෂණයන් මෙසේයි.

27 දින දිනමිණ ප්‍රවෘත්තිය වඩාත් භාවාතිශය ආකාරයකින් සෑම සියලු කරුණක්ම විස්තරාත්මකව දක්වමින් ලිපියක් පළ කොට තිබිණි. එහි සිදුවීමේ වින්දිත බාලවයස් දැරියගේ සම්පූර්ණ කය ඡායාරූපයක්ද පළ කොට තිබුණේ ඡායාරූපයේ මුහුණේ ඇස් පමණක් කලු කොටුවකින් වසමිනි. එසේම දිනමිණ ප්‍රවෘත්තිය තුළ දැරියගේ බාහිර පෙනුම, ඇයගේ ගතිලක්ෂණ පවා හුවාදක්වා තිබුණේ, ඇයට වක්‍රාකාරයෙන් චෝදනා නගනා ආකාරයකිනි. මෙවන් සිදුවීමක වින්දිතයෙකුට චෝදනා එල්ල කිරීම සහ, වින්දිතයාගේ බාහිර පෙනුමද දක්වමින් භාවාතිශය ලෙසින් ඉදිරිපත් කිරීම කෙතරම් මාධ්‍ය ආචාර ධර්මානුකූල වන්නේද?

අනෙක් අතින් 28 දින දිනමිණ ප්‍රවෘත්තිය සිදුවීම භාවාතිශය හැඳින්වීම් නොමැතිව, වින්දිතයාට චෝදනා කිරීමකින් තොරව මධ්‍යස්ථව ලෙසින් වාර්තා කොට තිබිණි.
මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #SinhalaPress #News #Dinamina**